## 61.

### මේ බිහිසුණු තත්ත්වය ජය ගන්න නම් යාච්ඤාවේ ප්‍රබලම තැන ඔබ ඉන්න ඕනැ. යාච්ඤාවේ ප්‍රබලත්වය දිස් වන්න ඕනැ. ඒ ගැඹුරු යාච්ඤාව තුළ තමයි, පියාණන් සියල්ල ස්පර්ශ කරල ජයග්‍රහණය උදා කරන්නේ.”

'ශුද්ධාත්ම පිය සටහන්' 56-60 පරිච්ඡේදවලින් මා ඇමතුවේ කතෝලික, කිතුනු ජනතාවට පමණක් නොව ඕනෑම ආගමක් අදහන හෝ කිසිදු ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන්ටයි. ලෝ වැසි සියල්ලන් දැන් මුහුණ දෙමින් සිටින්නේ ධර්ම අධර්ම මහා යුද්ධයටයි, ඒ සඳහා දෙවි පියාණන්ගේ මහා පවිත්‍රකරණයටයි. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. “ඉදිරියේ සිදුවන මහා කැළඹීම් තුළ මහා විනාශයන් තුළ කළකිරීම් නුඹලාට අනවශ්‍යයි. මන්ද, ඒ සියල්ල සිදුවන්නට නියමිතයි, ශුද්ධ ලියවිල්ල ඉටුවන පිණිස, මගේ මහා සැලැස්ම ඉටුවීම පිණිස.” ('ශුද්ධාත්ම පිය සටහන්' 40 පරිච්ඡෙදය) දැන් සිදුවෙමින් තිබෙන්නේ දැහැමි යුගයේ උදාව උදෙසා මහා ප්‍රසව වේදනාවයි. පොත් දෙකක් පාදක කර ගනිමින් අප සමාජයේ පවතින අසාධාරණකම්වල පැතිකඩක් විග්‍රහ කරන ලිපියක ප්‍රවීන ලේඛිකා කැත්ලීන් ජයවර්ධන මහත්මිය මෙසේ පවසන්නීය. ('අනිද්දා' ඉරු දින පුවත්පතකි. 2022.05.08) මෙය ඒ ලිපියේ අවසන් ජේදයයි.

“සියලු වාර්ගිකයන්ට ජීවත්වීමේ සමාන අයිතියක් ඇති බව අද දවසේ දී පිළිගන්නේ දියුණු මිනිසුන්ය. මේ පිළිගැනීම, මේ වැටහීම වඩාත් දියුණු ඉසව්වක් කරා ප්‍රසාරණය වන මතු යම් දිනෙක මානව දයාව (මානව වර්ගයා) අසල නැංගුරම් ලෑම වෙනුවට සකලවිධ සත්ත්ව ප්‍රභේද කෙරෙහි දයාන්විත වීමට මිනිසා යොමුවනු ඇතැයි අපි සිතමු. එහිදී මිනිස් වර්ගයා කෙරෙහි මෙන්ම සමස්ත ජීවීන් කෙරෙහි ද ඒ සමානාත්මතා ගුණය පැතිර වීමට මිනිසාට හැකිවනු ඇතැයි අපි විශ්වාස කරමු. සියලු වර්ගභේද, වර්ගවාද සහමුලින්ම ඉවත හෙළීමක් සර්වප්‍රකාරයෙන්ම පිරිපහදු වීමක් ලෙස අපට පෙනී යන්නේ එයයි. එහෙත් ඒ සඳහා මනුෂ්‍යයාට තව බොහෝ කාලයක් ගත කිරීමට සිදුවෙයි.”

එහි අවසන් වැකිය ගැන ලොකු වගකීමකින් මම මෙලෙස පවසමි. ඒ සඳහා තව බොහෝ කාලයක් බලා සිටින්නට සිදුනොවේ. එය නුදුරේදී සිදුවෙයි. එය සමාජ අසාධාරණකම් තුළ විඳවන සියල්ලන්ට ශුභාරංචියකි. එය දැහැමි යුගයේ උදාවයි. ඒ සඳහායි, දෙවි පියාණන්ගේ මේ මහා පවිත්‍රකරණය, මේ මහා පිරිපහදුව. ජේසු සමිඳාණෝ මෙසේ ද පවසති.

**2022 අප්‍රේල් 27**

“ඉතින් කොහොමද, දරුවනේ? මේ යන ක්‍රමය හොඳයිද? පියාණන්ගේ පවිත්‍රකරණය වේගයෙන් සිදුවෙනවා. මීටත් වඩා අති බිහිසුණු තත්ත්වයක් උදා වෙනවා, මුළු ලෝකයටම. තුනෙන් දෙකේ පවිත්‍රකරණය ප්‍රකාශයට පත්කරල තියෙන්නෙ. දැන් තමයි ඒක වේගවත් වෙමින් තියෙන්නේ. ඉතින් හැම දේශයක්ම මේ මහා පවිත්‍රකරණයට ලක් වෙලා. නමුත් මා මීට කලකට පෙර ප්‍රකාශ කළා, අහෝ ! මේ දේශයට සිදුවන විපතක මහත කියල. අද ඒ විපත් පැමිණෙමින් තිබෙනවා. මා මීට කලින් විශේෂ පණිවුඩ කිපයක් නිකුත් කළානේ. ඒ පණිවුඩ තුළින් මා විශේෂයෙන් ඇමතුවා දේශය පාලනය කරන රාජ්‍ය නායකයින්ට. ජනතාව උදෙසා ඒ රාජ්‍ය නායකයින් කුමක්ද කළේ, ඒ රාජ්‍ය නායකයින්ව විශ්වාසයට ගෙන ජනතාව ඔවුන් උදෙසා කුමක්ද කළේ, කියන දේ ඔවුන්ට හිතන්නට මම ඉඩ හැරියා. ජනතාවට පොරොන්දු දීලා ඒ පොරොන්දු එලෙස ඉටුනොකළොත් ඔවුන්ට කුමක්ද සිදුවන්නෙ? දැන් දෙවි පියාණන් ඔවුන් මුළුමනින් නෙරපා දමන්නට සූදානම්ව සිටිනවා. එනිසා මහා කැළඹීමක් ජනතාව අතර ඇති කරමින් යුක්තිය උදෙසා කතා කරන්නට පියාණන් ඒ හැම දෙනෙක්වම පොළඹවමින් සිටිනවා. මෙය පියාණන් විසින් ආරම්භ කරන ලද මහා පවිත්‍රකරණයක්. මේ දේශය පවිත්‍ර කරන්නට දේශයේ විනාශයට හේතු වී ඇති සියල්ල වෙනස් විය යුතුයි. එයයි, දැන් සිදුවෙමින් යන්නෙ. එනිසා මා ප්‍රේමණීය දරුවෙනි, වැඩිහිටි බාල මහළු සියලු දෙනා මේ සටන උදෙසා කෙටි කාලයක් දුක් විඳින්නට සිදුවෙනවා.

ඉතින් ඔබ හැම කෙනෙක්ම මොන තරම් අභියෝග ඔබ මධ්‍යයට ආවත් ඔබ දෙවිඳුන් සමග නම් සිටින්නෙ එතුමන් ඔබව සුරකිනවා. ධර්මය තුළ ජීවත් වන්නා ධර්මය විසින් සුරකිනවා. මොන තරම් භයානක තත්ත්වයක් ආවත් දෙවිඳුන්ගේ සුළැඟිල්ලේ එල්ලී හෝ ගමනේ යන්නට ඔබ ඔබවම පවිත්‍ර කර ගන්න. අන් අය දෙසට ඇඟිල්ල දිගු කරන්නට නොවෙයි, තමා දෙසට නෙත් යොමු කරමින් ඔබගේ ඇතුලාන්තය පරීක්ෂා කර බලන්න. ඔබගේ දුබලතාවයන් ගැන පියාණන්ගේ සමාව ලබා ගන්න. තමා තමාව සූදානම් කර ගැනීම තුළ තමා දෙවියන් වහන්සේගේ කැමැත්තට ආමෙන් කියන තැනට එන්න ඕනැ. තව නොබෝ දිනකින් මීටත් වඩා ඉතා බිහිසුණු තත්ත්වයක් එනවා. මා බොහෝ කලකට පෙර කීවා ආහාර හිඟයකට ද මුහුණ දෙන්නට සිදුවන බව.

මේ මොහොතෙ පියාණන්ගේ අඩවන් දෙනෙත් විවර වෙමින් තියෙන්නෙ. එනිසයි, මෙවැනි ආකාරයේ මහා පරීක්ෂණයක ලෝකය තබල තියෙන්නෙ. දෙනෙත් පූර්ණව විවර වෙමින් තමයි පියාණන්ගේ පාද ස්පර්ශය පොළොවට වදින්නෙ. ඒ මොහොත දැන් ආසන්නයි. පියාණන්ගෙ පාද ස්පර්ශය පොළොවට (පෘථිවියට) වදිනකොට මිනිත්තු කිපයකට මුළු පොළෝතලයම සෙලවෙනු ඇත. එනිසා දෙවියන් වහන්සේ සමගම සිටින්න. ඔබගේ හුස්ම රඳා පවතින්නේ ස්වාමින් වහන්සෙගෙ සුරතේ. බොහෝ කෙටි කාලයකදී මහා බිහිසුණු තත්ත්වයක් මේ දේශය තුළ හටගන්නවා. එනිසා වැඩි වැඩියෙන් යාච්ඤාවට යොමු වන්න. ගැඹුරු යාච්ඤාවකට දැන් ජනතාව යොමු වෙමින් සිටිනවා. ජනතාවගේ ඒ යාච්ඤාවලට සවන් දෙමින් පියාණන්ගේ දයාව දැන් දේශය වෙත යොමුවෙලයි තියෙන්නෙ. මහා පවිත්‍රකරණයක් ඉතා වේගයෙන් සිදුකරල ජනතාවට යහපතක් උදාකර දීමයි, දැන් සිදුවෙමින් තිබෙන්නෙ. විශේෂයෙන් මේ දේශයේ සාධාරණය මම බොහොම ඉක්මනින් ඉටුකරල දෙනවා. මේ වර්ෂයත් මේ ආකාරයෙන් මහා පරීක්ෂණයකට දාලයි තියෙන්නෙ. පවිත්‍ර වූ රාජ්‍යයක් පිහිටුවල ඒ හැම දෙයක්ම ඉක්මනින් මම සිදුකරනවා. එතකොට නිදහසේ ඔයාලගෙ දූ දරුවන්ගේ කටයුතු සිදුකර ගන්න පුළුවන්. එතෙක් මේ වර්ෂය තුළ අති භයානක තත්ත්වයක් තව ඉදිරියට තියෙන්නෙ.

ක්‍රිස්තු විරෝධියාගේ (Anti Christ) වැඩ දැන් ආරම්භ වෙලයි තියෙන්නෙ. එයින් කොටසක් තමයි මේ දේශපාලනයට ඇතුල් වෙලා තියෙන්නෙ. එයාගෙ සගයො ටික තමයි මේකෙ ඉන්නෙ. ඒක නිසයි බය නැතිව ඒ අයගෙ සහයෝගයෙන් මේ අය මෙතැන වැඩේ කරන්නට යන්නෙ. ඉතින් ඒ නිසා තමයි පියාණන් එදා දාවිත්ව ගොලියත් වෙතට යැව්වා වගේ දැන් කටයුතු කරමින් තිබෙන්නෙ. එදා දාවිත් දේව වචනයත් සමගයි එතැනට ගියෙ, එතැනට ගොස් ඔහු පැවසුවෙත් දේව වචනයයි. ඒ දේ තමා දැන් සිදුවන්නට යන්නෙ. පියාණන් දැන් ජනතාව කළඹවල තියෙන්නෙ. ඔබ ශුද්ධ බයිබලය කියවනව ඇතිනේ. ඒකෙ තිබෙන දේවල් තමයි, දැන් මේ දේශය තුළ සිදුවන්නෙ. යම් මොහොතක ජාති කුල ආගම් භේද වියැකෙමින් සියල්ලන් එකට එකතු වන තැනට දැන් පැමිණෙමින් තිබෙනවා. ඒ සියල්ලන් එකතු වෙලා මේ යක්ෂයා පරාජය කරන්නයි දැන් සූදානම් වන්නෙ. දැන් ජාති ආගම් කුල භේද සටන නොවෙයි, සියල්ලන් එකතු වෙලා යක්ෂයා පරාජය කරන්නට දැන් ඔවුන්ව ලුහුබඳිමින් ඉන්නවා. දැන් ජනතාව වියරුවැටිලා, ඒ හැම දේ තුළම අයහපත තුළ යහපත සිදුවන්නට යනවා. ජනතාව මෙතෙක් නොදුටු දේ දැන් දකිමින් තිබෙනවා. දැන් තමයි ජනතාවගේ ඇස් හොඳින් ඇරිල තියෙන්නෙ. එකිනෙක පක්ෂ පාට තෝරා ගෙන ජනතාව භේද වෙලා හිටියා. දැන් තමයි තේරුනේ ඒ කිසිම කෙනෙක්ගෙන් ඔවුන්ට සහනයක් නැහැ කියලා. ජනතාව දුක් විඳිනවා. පමණයි, ඒ දුක් විඳින දෙයින්වත් ඵලයක් ලබා ගන්න බැහැ, වෙනත් අය තමයි ඒකෙන් ඵලය භුක්ති විඳින්නේ. ඒ නිසා පියාණන්ගේ මහා පවිත්‍රකරණය ඇරඹිලා. ඒ මහා පවිත්‍රකරණය තමයි මේ සිදුවන්නෙ. සියලු රාජ්‍ය නායකයින්ටත් සියලු ජනතාවටත් පියාණන්ගෙ ඊළඟ පණිවුඩය මම ළඟදීම වතුරංගට ලබා දෙනවා. ඒ වෙබ් අඩවියට දාන්න කියලා.”

**2022 මැයි 19**

“දරුවෙනි, පියාණන්ගේ පරීක්ෂණය හා පවිත්‍රකරණය හොඳින් සිදුවෙමින් පවතින බව ජේනවද? මේ දේශය ගැන පියාණන් බොහෝ සේ බලා සිටියා, දේශවාසි ජනතාව දෙස බලා සිටියා. මැවුම්කරුවාණන් තම මුළු මැවීම දෙස බලා සිටියා. මැවීමේ ප්‍රධානම දේ තමයි මනුෂ්‍යයා. මනුෂ්‍යයා අත්දකින මේ මහා පීඩනය, ඔහු අත්දකින ප්‍රෝඩාවන් නිසා මනුෂ්‍යයා බොහෝ සේ වේදනා විඳින ආකාරය දෙස පියාණන් ඉතා වේදනාවෙන් බලා සිටිනවා. ජනතාව පාලකයන් තෝරා ගන්නවා. ඔවුන් දුන් පොරොන්දු ඔවුන් ඉටුකරයි කියල ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒත් ඒ පාලකයන් ජනතාවගේ මාර්ගයෙන් ඉස්සරහට ගියා මිසක් තම තමන් උදෙසා යමක් කර ගත්තා මිසක් ජනතාව ගැන බැලුවෙ නැහැ. ඔවුන් ජනතාව තලා පෙලා දාන්න පටන් ගත්තා. පියාණන් දැන් මහා බිහිසුණු තත්ත්වයක් ඇති කරල මුළු දේශයම පවිත්‍ර කිරීම ආරම්භ කළා. එක් කෙනෙක් දෙන්නෙක්ව නොවෙයි, පාර්ලිමේන්තුවට අයිති සියල්ලන් එයින් එළියට දාන තුරුම පියාණන් මේ කාර්යය කරගෙන යනවා. ඒ සඳහා හෙට රට බාරගන්න සිටින තරුණ ජනතාව පියාණන් විසින් දැඩි කරලයි තියෙන්නෙ. අද තරුණ ජනතාව හුඟක් දැනුවත්. කවුද ඇත්ත කරන්නේ කවුද බොරුව කරන්නේ කියන එක ඔවුන්ට පැහැදිළියි. ඉදිරියේ උදාවන දැහැමි යුගය උදෙසා පියාණන් මේ තරුණ ජනතාව මෙවලමක් කර ගනිමින් සිටින්නෙ. යුක්තිය උදෙසා පෙනී සිටින්නට මේ තරුණ ජනතාව දැඩි කරල තියෙන්නෙ, දෙවි පියාණන් විසින්. මොන පීඩනයක් ආවත් මොන බිහිසුණු තත්ත්වයක් උදා වුණත් ජීවිත පරිත්‍යාගී කරමින් හෝ පෙරටම යන්නට ඔවුන්ට ආත්ම ශක්තිය ධෛර්යය දීලා තියෙන්නෙ, දෙවි පියාණන්. ඒ දරුවන්ව ඉදිරියටම යවන්නට ඒ දෙමාපියන්ව ශක්තිමත් කරලයි තියෙන්නෙ, දෙවි පියාණන්.

මේ අරගලය මෙතැනින් නිමා වන්නෙ නැහැ. රටේ නායකත්වය සඳහා දෙවි පියාණන්ට සුදුසු කෙනා ඉස්මතු වන තුරුම මේ අරගලය මේ අය ඉදිරියටම ගෙන යනවා. ඒ සඳහා පියාණන් මහා පවිත්‍රකරණයක් සිදුකරනවා. එනෙක් මීට ද වඩා විනාශයන් සිදුවෙනවා, ලේ ගැලීම් සිදුවෙනවා, මහා ඛේදවාචකයක් බවට පත්වෙනවා. එහෙත් අවසානයේ දි පියාණන්ගේ සැලැස්ම ජයග්‍රහණය කරනවාමයි. යක්ෂයා අධර්මයේ ජයග්‍රහණය උදෙසා ඔහුගේ කොටස කරමින් සිටිනවා. මා ඊට කලින් රාජ්‍ය පාලනය ගැන පවසා තිබුණා, ජනතාවට දුන් පොරොන්දු නිසියාකාරව ඉටු නොකළොත් අහෝ ! ඔවුන්ට සිදුවන විපතක මහත කියල. ඒ විපත තමයි මේ සිදුවෙමින් පවතින්නෙ. දැන් ප්‍රෝඩාවන් ද සිදුවෙමින් තිබෙනවා. ඔවුන්ගේ නිවහන් ගිනි තැබීම් ඒ අය අතරින්මයි සිදුවන්නෙ. ඒ අය ඒවා නැවත ලැබෙනු ඇතැයි විශ්වාසයෙන් ඒවා සිදුවන්නෙ. අරගලයේ යෙදී සිටින තරුණයන් ඒවාට වැරදිකරුවන් කිරීම තමයි ඔවුන්ගේ සැලැස්ම. නමුත් මම ඒ සැලැස්ම පරාජය කරනවා. ඒ නිසා තමයි, රටේ නීති පද්ධතියම මම ජනතාවගේ පැත්තට නැඹුරු කෙරුවෙ. නීතිඥයින් කණ්ඩායම සාධාරණයේ අරගලය පැත්තට දැන් මා නැඹුරු කරලයි තියෙන්නෙ. ඒ අයගෙ ශක්තිය ඉදිරියේදීත් ඔවුන්ට ලැබෙනවා. සාධාරණය උදෙසා අරගලයක යෙදෙන මොවුන්ට පැරදුමක් ලබන්නට මා ඉඩ තබන්නෙ නැහැ. අසාධාරණකම් නිසා දැන් ජනතාව වියරුවැටිල කිවත් හරි, ඒක වියරුවක්ම නොවෙයි, ඒක තමයි ඒ අයගේ අයිතිය. තම අයිතිය උදෙසා ඔවුන් සටන් කරනවා.

මා මීට කලින් ප්‍රකාශ කළා වූ දේ නැවත ද ප්‍රකාශ කරනවා, රාජ්‍ය නායකයින්ට. ඒ රාජ්‍ය නායකයින් ද දෙවි පියාණන් වහන්සේගේ මැවීමක්. මොන ආගමක සිටියත් මේ සියල්ලෝම එකම ජනතාවක්. ඉතින් ඔවුනුත් සිදුවන්නට යන මහා විපතින් ආරක්ෂා වන්නට නම් එකිනෙකා තමා ගැන ගැඹුරින් මෙනෙහි කරමින් තම පාපි ස්වභාවය දකිමින් තමා යුක්තිසහගතව ද ක්‍රියා කළේ, අයුක්තිසහගතව ද ක්‍රියා කළේ එය ද ගැඹුරින් මෙනෙහි කරමින් දැන් සාධාරණත්වය උදෙසා අරගලයේ යෙදී සිටින ජනතාව අතට දීල ඒ අය පසුබැසිය යුතු මොහොතයි, දැන් උදා වී ඇත්තෙ. දැන් සාධාරණත්වය උදෙසා අරගලයක යෙදී සිටින තරුණ ජවයට ඉඩ දිය යුතු මොහොතයි. මා මැවුම්කරුවාණන් හැටියට ඔබ සැම මැවුම්කරුවාණන්ගේ පුත්‍රයන් හැටියට මා දේශයේ පාලකයන්ගෙන් ඉල්ලා සිටින්නෙ දැන් නිහතමානි වෙලා පහුබැහැල සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින තරුණ ජනතාවට දීල ඒ ගෞරවයත් රැගෙන මෙතැනින් ඉවත් වන්න කියන එකයි. එසේ නොවුණොතින් තත්ත්වය මීට ද වඩා බිහිසුණු වෙනවා. අවි ගත්තෝ අවියෙන් නසිති කියන්නෙ ඒකයි. ඒ දේ තමයි ඉදිරියේ සිදුවන්නට යන්නෙ. භීෂණය බොරුව හොරකම නිසා ලෝකයම හෙලා දකින තැනට මේ දේශය පත්වෙලා. මේ දේශයේ නායකයින් ගැන දැනටමත් ලෝකයේ බොහෝ අය දැනගෙන ඉවරයි. ඉතින් ඒ නිසා තව දුරටත් බොරුවට ඉඩ නැහැ.

දරුවෙනි, දැන් මම ඔබ සැම දෙනාගෙන්ම ඉල්ලන්නෙ යාච්ඤාවයි. ඒ යාච්ඤාවේදි ඔබ ආත්මගත වෙන්න ඕනැ, ඒ තරුණ ජනතාව සමග. ඔවුන් යුක්තිය උදෙසායි සටන් වදින්නෙ, තමන් උදෙසා නොවෙයි. මුළු මහත් ජනතාව උදෙසායි ඔවුන් සටන් වදින්නෙ. මා තෝරාගත් සංඝයේ ශ්‍රාවකයින් හැටියට ඔබගේ යාච්ඤාව මීට වඩා බලගතු කරගන්න ඕනැ. මේ මොහොතෙ ඔබ පිරිසක් සමග එක්ව යාච්ඤා කරද්දි හෝ තනියම යාච්ඤා කරද්දි ඔබ ආත්මගත වෙන්න ඕනැ, අර තරුණ දරුවන් එක්ක. ඒ අය එතැන සාධාරණය උදෙසා සටන් කරද්දි ඒ අය සමග යාච්ඤාවෙන් සම්බන්ධ වෙන්න ඕනැ. ඒකයි, මේ මොහොතෙ මා ඔබගෙන් බලාපොරොත්තු වන්නෙ. මොකද එන්න එන්නම රටේ තත්ත්වය බිහිසුණුයි . ඉදිරියෙදි කෑමට දෙයක් නැතිව මීට ද වඩා භයානක තැනට එනවා. මේ බිහිසුණු තත්ත්වය ජය ගන්න නම් යාච්ඤාවේ ප්‍රබලම තැන ඔබ ඉන්න ඕනැ, යාච්ඤාවේ ප්‍රබලත්වය දිස් වන්න ඕනැ. ඒ ගැඹුරු යාච්ඤාව තුළ තමයි, පියාණන් සියල්ල ස්පර්ශ කරල ජයග්‍රහණය උදා කරන්නෙ. මා මීට පෙර ඔබට කියල තියෙනවා ඔබ වෙහෙස මහන්සි වෙලා නම් ඉන්නෙ ගොඩාක් යාච්ඤා අවශ්‍ය නැහැ, ජේසුනී කියල ගැඹුරින් කිවත් ඇති කියල. මේ මොහොතෙ මගේ ශ්‍රාවකයින් වන ඔබට මා එසේ කියන්නෙ නැහැ. දරුවෙනි, දැන් තමයි යාච්ඤාව ප්‍රබලවම අවශ්‍ය මොහොත.

සාධාරණය උදෙසා අරගලයක යෙදෙන ඒ දරුවන්ට ආරක්ෂාව පතා සියලු ශුද්ධවන්තයින්ව ඔබගේ යාච්ඤාව තුළ ඒ පිට්ටනියට යවන්න, ඔබගේ මනසින්. සාධාරණය උදෙසා අරගලයක යෙදෙන ඒ දරුවන්ට සවියක් වන්නට අග්‍ර දූතයින් ඒ අරගල භූමියට කැඳවන්න, ඔබගේ යාච්ඤාව තුළ. අග්‍ර දූතයින් ඔවුන්ගේ ශරීරයට ආත්මානුභාවයෙන් ඇතුළු වෙලා හරි ඒ ප්‍රබල බලය අරගෙන අසාධාරණයට විරුද්ධව සටන් කරන්නට සාධාරණය ජය ගන්නට අග්‍ර දූතයින්ගේ ඒ බල මහිමය ඒ අයට ඉල්ලල දෙන්න, ඔබගේ යාච්ඤාව තුළ. සියලූ සුර දූත සේනාවට ආරාධනා කරල කියන්න මේ දරුවන්ට ඇතුල් වෙලා ඔවුන් මහත් ජවයකින් පුරවමින් සත්‍යයේ සාධාරණයේ කොඩිය ජය කනුව කරාම ගෙන යන්නට උපකාරි වනු ලෙස. එසේම සමිඳාණන් වහන්සේ ඉදිරියේ බලගතුව මොරගසන්න, දේශය ඔසවන, ජනතාවට සෙත සලසන කෙනාව ඔවුන් අතර තබමින් තෝරා ගනිමින් ස්ථිර කරන්න කියල. දේශයේ ලෝකයේ පාලකයින්

ආගමික නායකයින් ඇතුළු සියල්ලන් උදෙසා මා දුන් පණිවුඩ එකට ගොනු කරල සකස් කරල මා ළඟදි දෙන පණිවුඩය ද ඇතුලත් කරල ඔවුන් වෙත විගස යවන්න, දැන්වත් ඔවුන්ට වෙනස් වීම පිණිස. මැවුම්කරුවාණන් වහන්සේගේ පණිවුඩයක් ලෙස එය ඔවුන් අතට පත්කරන්න.

## ආපසු හැරී බැලීමක්

ජේසු සමිඳුන්ගේ මෙම ක්‍රියාකාරිත්වයට 'දහම් නවෝදය' සංඝය ලෙස අප සහභාගි කරගෙන 2022 ජුනි 7, වසර 26ක් සම්පූර්ණ විය. මෙම ක්‍රියාකාරිත්වය මුලපුරා ඇත්තේ 1991 අගෝස්තු මාසයේදිය. මෙම අනාවරණ සඳහා ජේසු සමිඳුන්ගේ දාසියන් ලෙස දෙදෙනෙක් ද ජේසු සමිඳුන්ගේ දාසයා ලෙස එක් අයෙක් ද උන්වහන්සේ උපයෝගි කර ගත්හ. මෙය දේව අනාවරණ රටාවන් තුළ මෙතෙක් සිදුනොවූ සුවිශේෂි අනාවරණ රටාවකි. ඇයගේ හෝ ඔහුගේ හෝ ආත්මය දෙවි පියාණන්ගේ සුරතේ තබා ජේසු සමිඳුන්ම එතුමාණන්ගේ ආත්මයාණන්ම ඇතුල්ව සිදුකරන අනාවරණ රටාවකි, මෙය. එනිසා ඒ මොහොතේ ඇයගේ මුවින් නික්මෙන කිසිම වචනයක් ඇයගෙන් නොවේ. ඒ කිසිම වචනයක් ගැන ඇය තුළ කිසිදු මතකයක් නැත. මෙය සුවිශේෂි අනාවරණ රටාවක් නිසා මනුෂ්‍ය වර්ගයා උදෙසා මෙහි සුවිශේෂි අස්වැන්නක් තිබිය යුතුය. මෙවැනි අසම්මත සුවිශේෂි අනාවරණ රටාවක් ඔස්සේ මෙතෙක් එන්නට අපට හැකිවීම ගැන අද සංඝයේ එඬේරා හැටියට මමත් සංඝයේ ශ්‍රාවකයින් හැටියට අපිත් මහත් සේ සතුටු වන්නෙමු. එහෙත් අප වසර 26ක් පුරා මේ දක්වා පැමිණි අසම්මත ගමන මිනිස් මනස්වලට ඔරොත්තු දෙන්නක් නොවේ. සමහර අනාවරණයන් සංඝයේ සමහර ශ්‍රාවකයින්ගේ පැකිලීමට හේතු වන විට සංඝයේ එඬේරා හැටියට මට මෙලෙස කියන්නට සිදුවූ අවස්ථා ඇත. "අපි පොඩි ජේසු මත නොවෙයි, බයිබලයේ සඳහන්ව ඇති ලොකු ජේසු මත සිටිමු." ජේසු සමිඳාණෝ 2012.11.15 සුජීවා උපයෝගි කර ගනිමින් මෙලෙස පැවසූහ. "මම විටෙක මැවුම්කරුවාණන් වන එකම දෙවියන් වහන්සේ ලෙස ද විටෙක නුඹලාගේ මිතුරකු ලෙස ද විටෙක සහෝදරයකු ලෙස ද විටෙක කුඩා දරුවකු ලෙස ද නුඹලාට කතා කළෙමි, විටෙක අඥානයකු ලෙස ද කතා කළෙමි. එලෙස මම ප්‍රබලවද දුබලවද කතා කළෙමි." ජේසු සමිඳුන් අපට එලෙස පැවසීමෙන් පසු මෙම සමහර අනාවරණ ගැන සංඝයේ ශ්‍රාවකයින් නොපැකිලෙනු පිණිස මහා ජේසු, කුඩා ජේසු යන දුර්වල යෙදුම් උපයෝගි කර ගැනීමට මට සිදු නොවීය.

ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් එම වදන් සංඝයේ ශ්‍රාවකයින් සමග ගැඹුරු විමසීමකට මම යොමු කළෙමි. දෙවි පියාණන්ගේ වචනයාණන් වන පුත්‍රයාණන් වන ජේසු සමිඳුන් මාංගවත්ව සිටි ඒ වසර 33 පුරා දෙවි පියාණන් තම පුත්‍රයාණන්ට අනාවරණය වූයේ දෙවි පියාණන් හැටියට පමණි. ඒත් ජේසු සමිඳුන් විසින් තෝරා ගත් මෙම සංඝය ඉදිරියේ දෙවියන් වහන්සේ ලෙස පමණක් නොව මිතුරෙක්, සහෝදරයෙක්, කුඩා දරුවෙක්, අඥානයෙක් ලෙස ජේසු සමිඳුන්ට පෙනී සිටීමට සිදුවූයේ ඇයි? ජේසු සමිඳුන්ගේ ශුද්ධවූ උපත තුළ ජේසු සමිඳුන්ගේ කිසිදු ආත්මාර්ථයක්, පාපයක් නොවීය. උන්වහන්සේ තුළ කඩමින් අඹන්නට කිසිදු ඌණතාවයක් නොවීය. එහෙත් සංඝයක් ලෙස අප ජන්ම පාපයෙන් යුතු ආත්මාර්ථයෙන් කිළිටි වූ මිනිස් කැළක් පමණි. අප තුළ කඩමින් ඇඹිය යුතු බොහෝ දේ ඇත. එනිසයි, ජේසු සමිඳුන් දෙවියන් ලෙස පමණක් නොව එහි සඳහන්ව ඇති අනෙක් සියලු ක්‍රම උපයෝගි කර ගත්තේ. 'ශුද්ධාත්ම පිය සටහන්' 1-61 පරිච්ඡේද තුළින් මා ලෝකයට දුන්නේ උන්වහන්සේ දෙවියන් වහන්සේ ලෙස අපට අනාවරණය කළ දේ පමණි. 'ශුද්ධාත්ම පිය සටහන්' 44 පරිච්ඡේදයේ මෙලෙස සටහන්ව ඇත. ජේසු සමිඳාණෝ මෙසේ පැවසූහ. "නුඹලා ජීවත් වන මේ දේශයයි, එදා මා මැවූ සුගති උද්‍යානය, ආදම් සහ ඒව සිටි සුගති උද්‍යානය. මුලින්ම මේ දේශයට 'ආදම් උයන' , 'පාරාදීසය' යනුවෙන් හැඳින්වූ තැනැත්තා එසේ කළේ දේව අනාවරණයකින්." (ඒ තැනැත්තා කවුදැයි අපි විමසුවා.) "එය පොත-පතින් දැන ගන්න. නුඹලාගේ ජාතික ගීතයේ උද්‍යානයක සෞන්දර්යය ද ඇතුලත්ව තිබීම ගැන මා සතුටු වෙනවා." පසුව 'ධර්මද්වීපය' නමින් හැඳින් වූයේ ද මේ දේශයයි. එදා මෙය 'පෙරදිග ධාන්‍යාගාරය' ද විය. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ධර්ම අධර්ම යුද්ධයේ මූලාරම්භය මෙම දේශයෙන්ය. මෙයයි, ගැළවීමේ දේශය." ධර්ම අධර්ම යුද්ධය අවසානයේ ධර්මය ජයග්‍රහණය කරමින් දැහැමි යුගයේ උදාව සිදුවනු ඇත. ලෝකයට ගැළවීම උදාවීම උදෙසා අද මේ දේශය මහා ප්‍රසව වේදනාවක යෙදී සිටී. එය ධර්ම අධර්ම මහා යුද්ධයයි. මිනිස් මනසට ඔරොත්තු නොදෙන මේ සිදුවීම් තුළ හැකි බොහෝ දෙනා රට හැර යනු ඇත. මේ ප්‍රසව වේදනාව තුළින් උදාවන මහා එළය යම් දිනක දකින විට ඔවුන් මහා ප්‍රීතියකින් මේ පුණ්‍ය භූමිය වෙත ආපසු පැමිණෙනු ඇත, මේ දේශය ගැන දෙවි සමිඳුන් පසසනු ඇත.

## ශ්‍රී ලංකාව නමැති දේශය උදෙසා දෙවි වූ ස්වාමින් වහන්සේ විසින් දෙන ලද පණිවුඩය මෙයයි.

## 23-ජූලි-2022

"මේ දේව ආඥාවයි. ශ්‍රී ලංකාව නමැති දේශය උදෙසා දෙවි වූ ස්වාමින් වහන්සේ විසින් දෙන ලද පණිවුඩය මෙයයි. සියලුම නායකයින් වෙතටයි. ඔබගේ නායකත්වය කොතැනද? ඒ නායකත්වය දරන්නා වූ සැවොම දැනගත යුතු අනාවරණය මෙයයි. ඔබ මේ මොහොතේ රාජ්‍යතන්ත්‍රයේ සේවය කරන්නෙක් නම් ඔබ මෙය ගැඹුරින් අයිති කර ගත යුතුයි. එය මෙසේය. රාජ්‍ය නායකයිනි, නුඹලාගේ විනාශය දැන් නුඹලා පසුපස හඹාගෙන එන ලැව්ගින්නක් මෙන්ය. දේශය පවිත්‍ර කිරීම මම මෙලෙස සිදුකරන්නෙමි. විටෙක ලැව්ගින්නක් ලෙස ද විටෙක තද කුණාටුවක් ලෙස ද එය පැමිණෙනු ඇත. ආදරණීය දරුවෙනි, මම නුඹලාට ප්‍රේම කරමි. එනමුත් දෙවිඳුන්ගේ මහා ඉවසීම තුළ නුඹලා කෙරෙන් දේව ගරුබියක් මම නොදකිමි. ආත්මාර්ථයේ බල තණ්හාවෙන් පිරී සිටින නුඹලාට වන විපතක මහත. දැන් එකා පිට එකා සටන් වදිනු ඇත, එය නොනවතිනු ඇත. ජනතාව විසින් දෙවිඳුන්ගේ නීති නියෝග අණපනත් කඩකරන ලද බැවින් පොළොව අපවිත්‍ර වී දූෂණය වී ඇත. එනිසා දේශය පවිත්‍ර කිරීම පිණිස දෙවි වූ ස්වාමින් වහන්සේ වන මම සියලු තරුණ දූ පුතුන් වැඩිහිටියන් සියලූ ජනතාව දැඩි කරමින් පවිත්‍ර වූ ධර්මිෂ්ඨ රාජ්‍යයක් ගොඩනැගීම පිණිස මෙය සිදුකරන්නෙමි."

"සියලූ රාජ්‍ය නායකයිනි, නිලය බලය හා ආත්මාර්ථය ආභරණයක් කරගත් ඔබට වන විපතක මහත. ජීවත්ව සිටින සෙනග කෙමෙන් අඩු වනු ඇත. මක්නිසාද ඔවුහු යුක්තිය උදෙසා දිවි පුදන්නෝය. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. දේශයේ සතුට සැනසුම පහව ගොස් ඇත. එය නැවත ඇතිකර ගැනීමට බොහෝ සේ සටන් කළ යුතුය. පොළොව පාපයෙන් බර වී ඇත. පොළොව කම්පා වී දෙදරා සුනු විසුනු වන්නට තරම් පාපයේ බර අධික වී ඇත. පාපයේ බර කොතෙක්දයත් ඉහළ අහසේ බලමණ්ඩල පහළ පොළොවේ සිටින පාලකයන්ට දඬුවම් කරන කාලය පැමිණ ඇත්තේය. දෙවියන් වහන්සේගේ ඉවසීමට සීමාවක් ඇත්තේය. දෙවියන් වහන්සේ ප්‍රේමය මෙන්ම උදහස ද වන සේක. පියාණන්ගේ බැල්ම මේ දේශය වෙත යොමුව ඇත. අනාදියේ ආදම් සහ ඒව පිළිබඳ සැලසුම් ආරම්භ වූයේ ද මේ දේශයෙනි. අධර්මිෂ්ඨ බලපෑම් නිසා දූෂ්‍ය වී ඇති මේ දේශය පවිත්‍ර කිරීමේ වගකීම ද දෙවියන් වහන්සේට පැවරී ඇත. එය දෙවියන් සතු කාර්යයකි. ඒ සඳහා දෙවියන් වහන්සේගේ වැඩ ඇරඹීමේ කාලයයි, දැන් පැමිණ ඇත්තේ. දරුවෙනි, දැන් නුඹලා දැහැමිව ජීවත් විය යුතුයි. විටින් විට මගේ ධර්මිෂ්ඨභාවයේ පාඩම කියා දීමයි, මගේ කාර්යය වන්නේ. මුහුද විටෙක නිශ්චල වන්නාක් මෙන්ම විටෙක දැඩි වනු ඇත. එලෙසයි, දේව උදහසත්. බොහොම නිශ්චලව සියල්ල දෙස මුළු මැවිල්ල දෙස බලා සිටිමින් එය අකීකරුකම් පාන කල, මුහුද මහා ඝෝෂා නගමින් තද කුණාටුවක් ලෙස රළ පිට රළ ගසමින් සියල්ල පවිත්‍ර කරන්නාක් මෙන් මැවුම්කරුවාණන් වන මා ද සියල්ලන් පවිත්‍ර කිරීමයි, දැන් සිදුවෙමින් පවතින්නේ."

"අරගල භූමියේ සිටින දරුවෙනි, මම නුඹලා අමතමි. සියලූ ජනතාව උදෙසා නුඹලා සියල්ල අත්හැර සියලූ ආශාවන් අත්හැර සියලූ අයිතිවාසිකම් අත්හැර යුක්තිය උදෙසා සටන් කරන ඔබ සියල්ලන් මම ආශිර්වාද කරමි. බිය නොවන්න. නුඹලා ජය ගනු ඇත. සියලූ අසත්‍ය පරාජය කරමින් සත්‍යය ජය ගනු ඇත. එකා පිට එකා වැටී තම ලේ හලමින් ඒ ලෙයින් පාපය තෙත් කරමින් මේ දේශයේ ධර්මිෂ්ඨ රාජ්‍ය නායකයා ගෙනෙන තුරු නුඹලා සටන් වදිනු ඇත. නුඹලා අතරින්ම ඒ නායකයා මම ස්ථාපිත කරමි. බොරුවෙන් වංචාවෙන් දූෂ්‍ය වී පිරී ඉතිරෙමින් තිබෙන මෙවැනි මොහොතක සියල්ලන්වම දැඩි කිරීම පිණිස සියලූ තරුණ දූ පුතුන් දැඩි කිරීම පිණිස මම මගේ රාජ්‍යයේ සගයන් නුඹලා වෙත එවා ඇත. මගේ බලගතු දූත පිරිස නුඹලා වටකොට ඇත. මම නුඹලාව ඒ ග්‍රහණය තුළ රඳවා ගෙන සිටිමි. මම නුඹලාව දේශය පවිත්‍ර කිරීම පිණිස අවියක් කර ගනිමි. සියලූ ජනයෙනි, අවදි වන්න. තමා උදෙසා නොව සියල්ලන් උදෙසා අවදිව එළියට බසින්න, එක්රැස් වන්න, එකමුතු වන්න, එක්සිත් වන්න. මක්නිසාද නුඹලාගේ අයිතිවාසිකම් උදෙසායි, ඔවුන් සටන් වදින්නේ. "

“සියලු ආගමික නායකවරුනි, දැන් එකමුතු විය යුතු කාලයයි. ජාති කුල ආගම් භේද බැලිය යුතු කාලයක් නොවෙයි, දැන් උදා වී ඇත්තේ. සියල්ලන් එකා මෙන් ඒකරාශී වෙමින් එක මවකගේ දරුවන් මෙන් එකට එකතු වූ කල සියලු බාධක පරාජය කළ හැකිය. අපි අත්වැල් බැඳ ගනිමු. මම නුඹලාට මහා බලසම්පන්න ආසිරි වැසි වස්වමි. එක්රැස් වන්න, එකමුතු වන්න, බිය නොවන්න, ඉදිරියටම එන්න. ජීවිතය පූජා කරන්නට සිදුවුණොත් නුඹලාට මගේ රාජ්‍යයේ තැනක් ලැබෙනු ඇත. අන් අය උදෙසා අනාගත දරු පරපුර උදෙසා දැහැමි යුගය ආරම්භ කිරීම උදෙසා යුක්තිය ඉල්ලා සටන් වදින සියල්ලෙනි, අවදිවව්. මම නුඹලාව දැඩි කොට ඇත්තෙමි. ධර්මිෂ්ඨ වූ රාජ්‍යයක් ගොඩනැගීම පිණිස තම ලේ වගුරුවමින් කුසට ආහාරයක් නොමැතිව පිපාසයට ජලය නොමැතිව දුක බෙදා ගනිමින් සියල්ල කැපකර ගනිමින් එකට ඒකාරාශී වෙමින් කරන්නාවූ මේ සටන මෙතැනින් නිමා නොවනු ඇත. සැබෑ ධර්මිෂ්ඨ රාජ්‍යය ගොඩනැගෙන තෙක් අපි සටන් වදිමු. එය ඉක්මනින් ජයග්‍රහණය කරා එළඹෙනු ඇත. එලෙස නව රාජ්‍යයක් පිහිටුවනු ලබයි. මේ දේශයෙන් මුළු ලෝකයට පණිවුඩයක් දෙමු. ලෝ වැසි සියලු රාජ්‍ය නායකයින්ට මෙය මරු පහරක් වනු ඇත. ලෝ වැසි සියල්ලන් මහත් ගෞරවයෙන් යුතුව මේ දෙස බලනු ඇත. ලෝකයට ආලෝකයක් වන්නාවූ මේ පුංචි දේශය ගැන ලෝක වාසින් යම් දිනෙක කතා කරනු ඇත.”

“රාජ්‍ය නායකයිනි, තවත් පමා නොවන්න. වෙනස් වන්නට හැරී එන්නට මනස්තාප වන්නට තවම කාලය තිබේ. දූෂිත වූ සියල්ල අධර්මයයි, එය යක්ෂ බලවේගයයි. එයට ගොදුරු නොවන්න. මනස්තාප වී සියල්ල තරුණ දූ පුතුන්ට භාර දී දැන් එය කරගෙන යාමට ඉඩ දී ඔබ පසු බසින්න. මම තවත් ඔබට කාලය දෙමි. ඔබ අද මහත් සැප වින්දත් දිනෙක විශාල වැලපීමකට මොරගැසීමකට ඔබ ඇතුළු වනු ඇත. එනිසා පාලකයිනි, අවදි වන්න, සියල්ලන් වෙත කරුණා නෙත් යොමන්න. ඔබ මෙතෙක් රැස් කළා වූ අධර්මයේ දේ නවතාලමින් මෙය ඔබගේ ජීවිතයේ හැරවුම්ලක්ෂයයක් කර ගනිමින් සියල්ල භාර දී නිහඬ වන්න. එසේ නොමැති වුවහොත් අහෝ ! ඔබට වන විපතක මහත. දේව උදහස ලැව් ගින්නක් මෙන් පසුපස លුහුබඳිනු ඇත, විටෙක තද කුණාටුවක් මෙන් ඔබ වටා පැමිණෙනු ඇත. ඔබගේ පාපයේ භයානකකම තවම ඔබ නොදනී. එය ඔබගේ හෘද සාක්ෂියට දැනෙන්නට සලසනු ඇත. මෙයයි, මගෙන් ලද භයානක පණිවුඩය. දැන්වත් අවදි වන්න. උද්ඝෝෂණයේ යෙදී සිටින සියලු දරුවෙනි, මම නුඹලා ආශිර්වාද කරමි. දේව රාජ්‍යයේ සිටින මගේ සියලු සගයෝ ඔබට සහය වෙති. මගේ ස්වර්ගීය දූත පිරිස ඔබ වටා රැස්ව ඇත, ඔබව මහත් සේ රකිමින් බලසම්පන්න කරමින් ඔවුන් ඔබට අවියක් වනු ඇත. මක්නිසාද දෙවි වූ ස්වාමින් වහන්සේ ඔබව එතුමන් සුරතේ අවියක් කර ගනිමින් මේ දේශය පවිත්‍ර කිරීම පිණිස ගෙන යනු ලබන සේක. ආමෙන්.”

**මා,**
**ඔබගේ, ගැළවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුස්.**

62.

## "අති බිහිසුණු දේ සිදුවුවත් මගේ සභාව ක්‍රියා විරහිත වන්නේ නැත. මන්ද, මම ඒ සමග සිටිමි. නමුත් මගේ දුක්ප්‍රාප්තිය මෙන් සභාව ද හිංසණයට හා අඳුරු පැයට මුහුණ දිය යුතුය."

මා ද උපත ලැබූ 20වන සියවසේ 4වන දශකයේදී ඉතාලියේ නේපල්ස්හි මරියා වැල්ටෝර්ටා තුමියට ජේසු සමිඳුන් දුන් අනාවරණයන්ගෙන් උපුටා ගත් වැකි කීපයකි, පහත සඳහන් වන්නේ. එය 'The End Times' 'කාලයේ අවසානය හා ක්‍රිස්තු පුනරාගමනය' ඇසුරෙනි. සිංහල පරිවර්තනය, ඒ. ඩී. එස් විජේතුංග.

"අති බිහිසුණු දේ සිදුවුවත් මගේ සභාව ක්‍රියා විරහිත වන්නේ නැත. මන්ද, මම ඒ සමග සිටිමි. නමුත් මගේ දුක්ප්‍රාප්තිය මෙන් සභාව ද හිංසණයට හා අඳුරු පැයට මුහුණ දිය යුතුය."

"මුල් වකවානුවේදී ශුද්ධවූ සභාව පීඩාවට පත්කරනු ලැබූ නමුත් සභාවේ උතුම් දරුවන්ගේ ආත්මානුභාවයෙන් එය පෝෂණය කර නැවත නැගිටුවන ලදී. අවසාන කාලයේදී ද නැවතත් එවැනි දරුවන්ම සභාව සමග සිටිනු ඇත. එම දරුවන් විසින් අන්ත ක්‍රිස්තුගේ දූතයන්ගේ ග්‍රහණයෙන් සභාව ආරක්ෂා කරගෙන පෝෂණය කර පවත්වා ගෙන යනු ලබයි."

"ජාතීන්ගේ කෝපය විද්‍යමාන වීම මගේ කෝපය පිළිබඳව අණාතුරු ඇඟවීමයි. මේ පැය වේදනාකාරී එකකි. මගේ සියලු දරුවන් ද මේ වේදනාකාරී තත්ත්වයන් තුළින් ගමන් කළ යුතුය, එය මඟ හැරිය නොහැකිය. මන්ද, සියලු දෙයක්ම සම්පූර්ණ විය යුතු බැවිනි."

"එහෙයින් මේ සියලු දුෂ්ඨ බලවේගවල කූට ක්‍රියාකාරකම් අභිබවා යා හැකි බලයක් ජනතාවට අවශ්‍ය වී ඇත. එනිසා ධර්මය අවශ්‍ය අයට මගේ ආලෝකය ලබා ධර්මය තුළ වඩාත් හොඳ පන්නරයක් ලබා ගැනීම තෙක් ඔවුන් ආරක්ෂා කිරීමට අවශ්‍ය ආවරණ ජාලයක් මම ඔවුන්ට ලබා දෙන්නෙමි."

"මගේ ප්‍රතාපවත් නැවත පැමිණීම නව ක්‍රමවේදයක් හා නව බලයක් ඇතිව වර්තමානයට යෝග්‍ය අයුරින් ප්‍රකාශ වෙයි."

"ඔවුන්ගේ සම්පූර්ණත්වය සඳහා නව අපෝස්තලිකත්වයක් තුළින් අවසාන ඉගැන්වීම ඔවුන්ට ලබා දෙමි. මා ඔබට මුලින් දුන් සුභාරංචිය වෙනස් නොවේ. එහෙත් එය නව බලයක් ද සහිතව එය ඔබට පහසුවෙන් තේරුම් ගත හැකි වනු ඇත. අද ඔබට තේරුම් ගත නොහැකි දේ ද ඔබට තේරුම් යනු ඇත."

"මුළුමනින්ම යක්ෂාත්මයට අවනත වීමට දෙනු ලබන ඉගැන්වීම් තුළින් කරනු ලබන ව්‍යාජ තාවකාලික ආශ්චර්යයන් නිසා මුලා වී යන අය මගින් දෙවියන් වහන්සේට අභියෝග කිරීමට මොවුහු (මකරා සහ මෘගයා) ඉදිරිපත් වෙති. මෙම මොහොතේ දී එම පාතාලයේ ක්‍රියාව ස්වර්ගයේ නිර්මාණයක් ලෙස පෙන්වා ඔබව මුලා කිරීමට නපුරා ක්‍රියාත්මක වන බැවින් එම අවස්ථාවේ දී මනුෂ්‍යයා අතිශයින් ප්‍රවේශම් විය යුතුය."

"අන්ත ක්‍රිස්තුව වරක් පරාජය කර කෙටි සාම කාලයක් මනුෂ්‍යයාට ලැබෙයි. ---- ක්‍රිස්තු විරෝධීන් අවසන් වරට ප්‍රකාශයට පත් වෙමින් සිය දුෂ්ඨකම් හා හිංසන ක්‍රියා උච්චාවස්ථාවටම ගෙන එයි. එය සාතන්ගේ අවසාන වාරයයි."

"මම පොරොන්දු ඉටු කරන බැවින් මා පොරොන්දු වී ඇති ලෙස මගේ සාම රාජ්‍යය පැමිණීමට නියමිත වේලාවේදී පැමිණෙන්නේය."

"මන්ද, අන්ත ක්‍රිස්තුගේ පැයේ සිට ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම අතර යම් කාල සීමාවකට පමණක් පවතින සටන් විරාමය කෙටි එකකි. ඇත්තෙන්ම තෝරා ගත් අය වෙනුවෙන් අවසාන පීඩා කාලය කෙටි කරනු ලබන්නේය. නව ජවයකින් සාතන්ට එරෙහි සටනට සූදානම් වීම සඳහා නව ජවයක් ලබා ගැනීම පිණිස කෙටි සාම කාලයක් ඔබට දෙනු ලබන්නේය."

“විනාශයේ පළමු අදියර අන්ත ක්‍රිස්තුගේ (Anti-Christ) පෙර ගමන්කරුවන් අතින් සිදුවෙයි. ඉන්පසු මගේ පෙර ගමන්කරුවන් විසින් මගේ පැමිණීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලබයි. සාතන්ගේ පෙර ගමන්කරුවෝ මනුෂ්‍යයින්ගේ ගරු නම්බු තනතුරු සහ මහේශාක්‍යභාවය ඇතිව පෙනී සිටිති. දේව පුත්‍රයාගේ පෙර ගමන්කරුවෝ ඔවුන්ගේ රජාණන් ලෙසම එම ඔටුන්න ලබා ගනිති. ඔවුන්ගේ ඔටුන්න නම් අන් අය වෙනුවෙන් දුක් පීඩා විඳීමයි.”

2022 මැයි 19 අප සංඝය අමතා ජේසු සමිඳුන් දුන් පණිවුඩය මා 'ශුද්ධාත්ම පිය සටහන්' 61 පරිච්ඡේදයේ සටහන් කර ඇත. ඒ පණිවුඩයේ ජේසු සමිඳාණෝ තව දුරටත් මෙසේ පැවසූහ. “ඉදිරිය මීට ද වඩා තත්ත්වය බිහිසුණු වෙනවා. ජනතාවට බොහෝ පීඩා විඳින්න සිදුවෙනවා. ඒ සියලු පීඩා තාවකාලිකව හෝ නිමා වෙමින් ඊළඟට උදා වන්නේ ප්‍රිතිමත් කාලයක්, සශ්‍රික කාලයක්. (ජේසු, එය දැහැමි යුගයේ උදාවද? ඊට පෙර සිදුවන දෙයක්ද? මම ජේසු සමිඳුන්ගෙන් එලෙස විමසීමි.) “එය ඊට පෙර සිදුවන දෙයක්. සියල්ලන් වින්ද පීඩනයට හරි යන්න ප්‍රිතිමත් කාලයක් දෙනවා. එයින් කලකට පසු තව තවත් දේවල් සිද්ධ වෙන්න තියෙනවා. දැන් එළිදරව් පොතේ සඳහන් ඒ මුද්‍රා හතෙන් තුනක් මේ වෙද්දි එළිදක්වල ඉවරයි. මේ 4වන එක කීවොත් හරි. දැන් ඒක තමයි, මේ ආරම්භ වෙමින් තිබෙන්නේ. ඒකට අයිති ඊට වඩා බිහිසුණු දේවල් ඉස්සරහට සිදුවන්න තියෙනවා.”

මා ඉහත සඳහන් කළ ජේසු සමිඳුන්ගේ සියලු වදන් ද මෙහි 61 පරිච්ඡේදයේ මා සටහන් කළ 2022 අප්‍රේල් 27 හා 2022 මැයි 19 සටහන් ද උපයෝගි කර ගනිමින් ධර්ම අධර්ම යුද්ධයේ ඉදිරි ක්‍රියාකාරිත්වය පිළිබඳව මෙනෙහි කිරීමකට පිවිසෙන්නට මම අදහස් කරමි. “ධර්ම අධර්ම යුද්ධයේ මූලාරම්භය මෙම දේශයෙන්ය.” එයයි, දැන් මේ දේශය තුළ ඇරඹී ඇත්තේ. විශ්ව මැවුම්කරුවාණන් වන සැබෑ වූ එකම දෙවියන් වහන්සේ මේ දේශයේ සාධාරණය උදෙසා සිදුවන අරගලයට උන්වහන්සේගේ සර්වබලධාරි හස්තය තබා ඇත. එනිසා සාධාරණත්වය උදෙසා සිදුවන මේ ජන අරගලය ජයග්‍රහණය කරනු නියතයි. අප දේශය තුළ බලගතු ලෙස විකුම් පාමින් සිටින අධර්මාධිපතිගේ පරාජය සිදුවනු නියතයි. ධනය, බලය, ජනප්‍රියත්වය (මැමෝනා) තම එකම අරමුණ කරගත් පිරිසකි, අධර්මයේ ජයග්‍රහණය උදෙසා අධර්මාධිපති (ලුසිෆර්, සාතන්, යක්ෂයා, නපුරා, ක්‍රිස්තු විරෝධියා, අන්ත ක්‍රිස්තු, මෘගයා, දාමරිකයා) අත මෙවලම් වන්නේ. 2022 අප්‍රේල් 9 ගාලු මුවදොර දී සාධාරණය උදෙසා මුල පිරුණු තරුණ අරගලය සියලු බාධක අභියෝග තර්ජන ගර්ජන මැද දිනෙන් දින වැඩෙමින් එය මුළු රට පුරා ව්‍යාප්ත වෙමින් සිදුවන නිරායුධ මහා ජන අරගලයක් දක්වා වර්ධනය වනු ඇත. අධර්මාධිපතිගේ අරමුණු ඉටු කිරීම උදෙසා සාධාරණයේ අරගලය පරාජය කරන්නට අධර්මාධිපති අත මෙවලමක් වෙමින් ක්‍රියා කරන්නෝ තම මුළු දේශපාලන බලය හා ධන බලය යෙදුවත් ඒ සියලු උත්සාහයන් පරාජය වෙමින් අධර්මාධිපති අන්ත පරාජයක් ලබනු ඇත. ඒ පරාජය ඔහු බරපතල ලෙස තුවාල වීමකි. ඒ තුවාලය සුව වීම සඳහා ඔහුට සටන් විරාමයක් අවශ්‍ය වනු ඇත. ඊට හේතුව මෙයයි. ඒ පරාජයේ තුවාලය නිසා වඩාත් වියරු වැටෙන මෘගයා ඉන්පසු 'තුවාලය සුව වූ මෘගයා' හැටියට ලෝක කරලියට බලගතුව පිවිසෙනු සඳහාය. ඒ ඔහුගේ අවසාන අති බිහිසුණු සටන උදෙසාය. “ඔහු ඒ සඳහා දෙවියන් වහන්සේගේ අවසර ඉල්ලා ඇත. උන්වහන්සේ ඒ සඳහා ඔහුට අවසර දී ඇත.”

අප දේශයේ ඇරඹී ඇති ධර්ම අධර්ම යුද්ධයේ පළමු සටනින් නපුරා පරාජය වීමත් සමග ඇරඹෙන්නේ සටන් විරාමයක් වැනි කාලයකි. එවැන්නක් පරාජය නිසා තුවාල වූ මෘගයාට ද අවශ්‍ය බව මම පැවසීමි. එවැනි සටන් විරාමයක් දෙවියන් වහන්සේට ද අවශ්‍යය. එය ප්‍රධාන කරුණු දෙකක් නිසාය. එය දිගු කාලයක් අන්ත කටුක පීඩාකාරි අත්දැකීම් රැසකට මුහුණ දුන් අප දේශයේ ජනතාවට යම් කාල සීමාවකට හෝ ප්‍රිතිමත් සශ්‍රික ජීවිතයක් ලබා දීම සඳහාය. ඒ සඳහා දෙවන කරුණ මෙයයි. අධර්මාධිපතිගේ අති බිහිසුණු අවසාන සටන ඇරඹෙන්නට පෙර ධර්ම ප්‍රතිෂ්ඨාපනය හෙවත් ධර්මය නැවත පිහිටුවීම සඳහා අවස්ථාව උදා කිරීමය. එය සියලුම ආගමික ශාස්තෘවරුන් දෙසූ නිවැරදි දහම ජනතාව වෙත ප්‍රබලව ගෙන යමින් නපුරාගේ ඉදිරි මහා සටනට අභීතව මුහුණ දෙනු සඳහා ලබා දෙන පන්නරයකි. ඒ සටන් විරාමයෙන් පසු තුවාලය සුව වූ මෘගයාගේ අවසන් මහා සටන ඇරඹේ. එය වසර තුනහමාරක හෙවත් මාස 42ක අති බිහිසුණු කාලයක් බව ශු. බයිබලයේ දානියෙල්ගේ පොත හා එළිදරව් පොත සාක්ෂි දරයි. මැවුම්කරුවාණන් වහන්සේ පිළිබඳව විශ්වාසය මනුෂ්‍යයා තුළින් මුළුමනින් නැති කර දමන්නට අධර්මාධිපති උපරිමය කරනු ඇත. ඒ සඳහා ඔහුගේ උපරිම බලය ප්‍රකාශ කරනු ඇත. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ සඳහන්ව ඇති මැවුම්කරුවාණන් වහන්සේගේ සියලු ප්‍රබල ක්‍රියාවන්ටත් වඩා ප්‍රබල ක්‍රියා මගින් උන්වහන්සේ ද සාක්ෂි දරනු ඇත. ඒ අවසන් සටනින් ද නපුරා අන්ත පරාජයට පත් වී ඉන්පසු ඔහු දහස් වසරකට බැඳ දමමින් ජේසු සමිඳුන්ගේ පුනරාගමනය හා දැහැමි යුගයක උදාව සිදුවේ. දැනට අප දේශය තුළ මුලපුරා ඇති ධර්ම අධර්ම යුද්ධයේ මෙම පළමු සටනින් සාධාරණය උදෙසා අරගලයක යෙදෙන ජනතාවට ජය

අත්කර දෙමින් මැවුම්කරුවාණන් මේ දේශය උදෙසා තෝරා ගන්නා නව දැහැමි නායකත්වය අධර්මාධිපතිගේ ඉදිරි ක්‍රියාකාරිත්වයට අප දේශය තුළ කිසිසේත් ඉඩ නොදෙන නායකත්වයක් වේවා ! යි පතමු. එවිට ඉදිරි ලෝකයටම "මෙයයි, ගැළවීමේ දේශය" ("මැවුම්කරුවාණන් මේ දේශය උදෙසා තෝරා ගන්නා නව දැහැමි නායකත්වය" ගැන මා වචන ස්වල්පයක් පැවසිය යුතු යැයි මට හැඟේ. "සියලු දෙනාටම ආගමක් ඇත. නමුත් ආගමක් නැත්තේ දෙවියන් වහන්සේට පමණි." ඒ ගරු මර්සලින් ජයකොඩි පියතුමාගේ වචන ස්වල්පයකි. එය සත්‍යයකි. මැවුම්කරුවාණන් වහන්සෙයි, සියලු ආගමික ශාස්තෘවරුන් මෙලොවට එවා වදාළේ. උන්වහන්සේයි, ධර්මයාණෝ. උන්වහන්සේගේ දහම අඩු වැඩි වශයෙන් ඒ සැම ආගමක් සමග බෙදී ගොස් ඇත. උන්වහන්සේට ජාති භේද ආගම් භේද කිසිවක් නැත. ලෝ වැසි සියල්ලෝ උන්වහන්සේගේ දරුවෝ වෙති.)

'ශුද්ධාත්ම පිය සටහන්' 61 පරිච්ඡේදයේ දී අපගේ ගමන් මග පිළිබඳව ආපසු හැරී බැලීමකට මම පිවිසුණෙමි. ඒ ඔස්සේ ඔබට කිය යුතු තවත් කරුණු කිපයක් ඇත. "දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන ජනතාව දැනුවත් කරන්නැ"යි ජේසු සමිඳුන් සුජීවා මගින් මට පැවසූ බැවින් මම ඒ සඳහා 'ශුද්ධාත්ම පිය සටහන්' 54, 55 පරිච්ඡේද සැකසීමි. ඒ කාර්යය තුළයි මට සිහිපත් වූයේ, දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ගැන මා අත්දැකීමක් ලබා වසර 40ක් සපිරෙන බව. 'ශුද්ධාත්ම පිය සටහන්' 56-60 පරිච්ඡේද සකසන ලෙස මේ අනාවරණ රටාව තුළ ජේසු සමිඳුන් මට පැවසුවේ නැත. මා තුළ ඇති ජේසු සමිඳුන්ගේ සියුම් හඬ තව තවත් වර්ධනය කර ගන්නා ලෙස මේ ක්‍රියාවලිය තුළ ජේසු සමිඳුන් මට නැවත නැවතත් පවසා ඇත. මා තුළ ඇති ජේසු සමිඳුන්ගේ සියුම් හඬේ මග පෙන්වීම අනුවයි, මා ඒ පරිච්ඡේද පහ සැකසුවේ.

ජේසු සමිඳුන් උන්වහන්සේගේ මෙම අනාවරණයන් දීම සඳහා උපයෝගි කර ගන්නා උන්වහන්සේගේ ප්‍රථම දාසිය වන සුජීවා ජයලත් සොයුරිය ගැන මා කෙටියෙන් හෝ සටහන් කළ යුතුය. ඇය දැන් වසර 50ක් සපිරෙන මවකි. මෙම ක්‍රියාවලිය ආරම්භයේ සිටම මේ දක්වා ඇය රෝගි තත්ත්වය තුළ අපමණ වේදනා විඳිමින් ජේසු සමිඳුන්ට තමා මගින් ක්‍රියා කිරීමට ඉඩ දෙන්නිය. ඒ ගැන ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "මට ක්‍රියා කිරීමට ඉඩ දුන්නා වූ මගේ දියණිය, මගේ හැම ඉල්ලීමකටම ආමෙන් කී ආකාරය මම දිටිමි. පුංචි දරුවන් රණ්ඩු වෙමින් නැවත යහළු වන්නාක් මෙන් ඇය මා හා ගත කරන්නිය, ඇය වැළපෙන්නිය නැවත මට ඉඩ දෙන්නිය. මගේ ක්‍රියා කිරීම තුළ ඇයගේ දෙනෙතින් මොන තරම් කඳුළු ගලා යන්නට ඇත්ද? ඇයටත් මනුෂ්‍ය ආශා මනුෂ්‍ය සිතුවිලි තිබේ. එහෙත් ඇය මට ගෞරවාන්විතව ආදරය කරන්නිය. ඈ මට කීකරු වන්නිය. මා ඇයට දුන් එඬේරාට ද නිහතමානිව කීකරු වන්නීය. මම බලා සිටිමි. ඇය විටෙක කුඩා දරුවකු මෙන් වැළපෙන ආකාරය. ඔබ හැම ද කුඩා දරුවන් මෙන් වන්න. එයයි, සැබෑ ජීවිතය." (33 පරිච්ඡේදය)

ස්ත්‍රියක් මගින් ජේසු සමිඳුන් අප අමතන නිසා මෙය ලාබ සිල්ලර දෙයක් ලෙස කෙනෙක් දකින්නට පුළුවන. එය කිසිසේත් එසේ නොවේ. එය සංකීර්ණ දෙයකි, ශුද්ධවූ දෙයකි. ඒ සඳහා උදාහරණ දෙකක් මා ඔබ ඉදිරියේ තබන්නට කැමතියි. සංඝයක් ලෙස ජේසු සමිඳුන් අප ගෙන යන මේ ගමන මනසට පමණක් නොවෙයි මහා පොළොවට ද ඔරොත්තු නොදෙන බව ජේසු සමිඳාණෝ පවසති. ගමන් විඩාවෙන් හෙම්බත් වෙමින් අප අතර මේ සිදුවන්නේ කුමක් දැයි ජේසු සමිඳුන්ගෙන් මග පෙන්වීමක් පැතුවත් අපට ඒ සඳහා එතුමන්ගෙන් වචනයක් හෝ නොලැබිණි. උන්වහන්සේ අවසානයේ ඒ ගැන වචනයක් දුන්නේ සංඝයේ ශ්‍රාවකයෙක් ද නොවන ග්‍රින්ති කුරේරා සොයුරියටයි. (ඇය, ප්‍රවීන නාට්‍යාචාර්ය වික්ටර් කුරේරා මහත්මාගේ වැඩුමහල් දියණියයි.) ඒ පණිවුඩය මෙයයි. "මා තෝරාගත් මේ සංඝයේ ප්‍රධාන දේ අත්තිවාරමයි. දැනට එයයි, සිදුවෙමින් පවතින්නේ. ඉදිරියේදී ඒ අත්තිවාරම මත ගොඩනැගිල්ල සෑදෙනවා. එවිට කාගෙත් අවධානය යොමු වන්නේ ගොඩනැගිල්ලේ අලංකාරය වෙතටයි. එවිට බොහෝ දෙනෙකුට අත්තිවාරම ගැන මතකයක් නැහැ. මේ සංඝය දැනට යමින් සිටින ගමනේ ජේන්න වැඩ ගොඩක් නැහැ." (51 පරිච්ඡේදය) ජේසු සමිඳාණෝ ඒ පණිවුඩය ඇයට දෙමින් ඇයට පැවසූහ, අපගේ දින තුන යැදුමට ගොස් ඒ පණිවුඩය සංඝයේ එඬේරා හා ශ්‍රාවකයින්ට පවසන ලෙස. ඇය 2018 මැයි 13 එය අපට ප්‍රකාශ කළාය. ඒ වන විට වසර 22ක් සපිරෙමින් තිබුණු අපගේ මේ අසම්මත ගමන තුළ විඳවමින් මැරෙමින් සිටි අපට එය උත්ථානයක පණිවුඩයක් විය. එය, මරණයෙන් උත්ථාන වූ ජේසු සමිඳුන් ඒ උත්ථානයේ පණිවුඩය තම ශ්‍රාවකයන්ට පවසන්නැයි මග්දලාහී මරියාට පැවසුවාක් මෙනි. මා එයින් ඉඟි කළේ මේ අනාවරණ රටාවේ සංකීර්ණත්වය ගැන යි. එහි ඇති ශුද්ධභාවය ගැන ද මා වචනයක් කිව යුතුය. ශ්‍රාවකයෙක් නොසැලකිල්ලෙන් අනවශ්‍ය දෙයක් ජේසු සමිඳුන්ගෙන් විමසුවොත් ජේසු සමිඳාණෝ මිනිත්තුවක් පමණ වේලාවක් ඇය මගින් ශබ්දනගා සිනාසෙති. ඊළඟ මිනිත්තුවේ ඒ මුහුණ බලන්නට බැරි තරම් රෞද්‍ර පෙනුමක් ගනී. මා එවැනි අවස්ථා තුනක් අත්දැක ඇත. මේ තත්ත්වය අත්දුටු පසු ගරුබියක් ඇතිවෙයි, මේ ක්‍රියාවලිය තුළ ශ්‍රාවකයින් හැසිරෙන්නේ. ජේසු සමිඳුන් ක්‍රියා කරන මොහොතේ හැර අනෙකුත් සැම අවස්ථාවකම ඇය සාමාන්‍ය ස්ත්‍රියක් පමණක් බවත් ඇයට විශේෂ ගෞරවයක් හිමි නැති බවත් ජේසු සමිඳාණෝ

පවසති. ඇය උපයෝගි වෙමින් සිදුවන මෙම ක්‍රියාව පරික්ෂා කරන්නට පැමිණෙන අයෙකුට ජේසු සමිඳුන්ගෙන් ලැබෙන්නේ ද පිළිතුරක් නොව පරීක්ෂණයක් පමණක් බව ජේසු සමිඳාණෝ පවසති.

'දහම් නවෝදය' සංඝය ගැන ද මා ඔබට කතා කළ යුතුයි.

'දහම් නවෝදය'
අධර්මයේ මහා අරගලයට එරෙහිව
'කිසිවෙකුට වැසිය නොහැකි විවෘත දොරක්.'

අපගේ වෙබ් අඩවිය ආරම්භයේම එලෙස සටහන්ව ඇත. එය ජේසු සමිඳුන් විසින්ම 'දහම් නවෝදය' දූත මෙහෙයට දෙන තේමාවයි. මේ සංඝයේ දැනට සිටින ශ්‍රාවකයින් ගණන කියන්නට එක අතක ඇඟිලි ගණන සෑහේ. එහෙත් එය අපට ගැටළුවක් නොවේ. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ඇන්තනි, ඔබ සමග සිටින සියල්ලන් ඔබ අත්හැර ගියත් ඔබ තනිවම හෝ මේ ගමන එන්න. එවිට මම සියල්ල සිදුකරමි." දහම් නවෝදය සංඝයේ ශ්‍රාවකයන් ලෙස තවත් අය අප සමග සිටියහ. මේ ගමනේ ඇති කටුකබව හා අසම්මතය නිසා ඔවුහු විසිර ගොස් සිටිති. මේ සංඝයේ ගමනේ ස්වභාවය පිළිබඳව ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "ශුද්ධවූ සැලැස්ම උදෙසා ශුද්ධවූ වගකීම උදෙසා නුඹලාව මා ගෙන යන ගමන් මාර්ගය මෙලෙසාකාරයෙන්ම ගෙන යන්නට මම සිතුවෙමි. මන්ද, මෙය කිසිදු න්‍යායකට හසු නොවෙනවා ඇත. කිසිදු දර්ශනයකට හසු නොවෙනවා ඇත. මා නුඹලාව ගෙන යන ගමන පැටලුන නූල් බෝලයක් මෙන්ය. එහෙත් එහි නිරවුල නුඹලා අතරේ තබමින් දෙවි වූ ස්වාමින් වහන්සේ සියල්ල එකිනෙක නිරවුල් කර ගන්නා ආකාරය නුඹලාට කියා දෙමින් සිටිති. මේ පරම සත්‍යය උදෙසා යන ගමනකි. පරම සත්‍යයම සොයා යන ගමනකි. මෙය මුළු මිනිස් ජනතාවගේ ගැළවීම උදෙසා නුඹලා මගේ අතේ අතකොළුවක් වෙමින් යන ගමනකි." (42 පරිච්ඡේදය) දහම් නවෝදයට මූලස්ථානයක් නැත, කාර්යාල පහසුකම් නැත, යාන-වාහන නැත, මිල මුදල් නැත, "දුගීභාවයේ ධනයෙන් පිරී ඉතිරේවා" යන්න අප ගැන ජේසු සමිඳුන්ගේ පැතුමයි. මෙය, එකිනෙකා තමා සිටින නිවෙස තුළ සිටිමින් සිදුවන ක්‍රියාවකි. මෙය, සියල්ල සමිඳුන් සුරතේ තබා උන්වහන්සේගේ කැමැත්තට නතු වෙමින් ගත කරන මොහොතේ ජීවිතයකි. සංඝයේ එඬේරා හැටියට මා විසින් දැනට කිව යුතු සියල්ල සත්‍යවාදීව පැහැදිලිව සරලව ඔබ ඉදිරියේ තබා ඇත. ('ශුද්ධාත්ම පිය සටහන්' 1-62) මේ මොහොතේ ඔබට කියන්නට තවත් කිසිවක් මට නැත. මින්පසු කුමක් දැයි ඔබ අපෙන් විමසන්නට පුළුවන. ජේසු සමිඳුන් අපට පවසන දේ කොතරම් අසම්මත වුවත් අපි කරන්නෙමු. දැහැමි යුගයේ උදාව දක්වා 'දහම් නවෝදය' ගමන් මගේ රිද්මය එයයි. එමගින් ජේසු සමිඳුන් බොහෝ දේ සිදුකරගනු ඇත.

"අද ලෝකය අරගලවලින් ගහණ වී ඇත්තේ කිසිවකු ආගමට මුල් තැන නොදෙන නිසාය. ---- ආගම යනුවෙන් මා අදහස් කළේ මමත්වය නැති කර ගැනීමේ සම්‍යක් දෘෂ්ටියයි. පුද්ගලයාත් ඒ අනුව සමාජයත් ඇතුලතින් සැපවත් වීමේ හරි ජීවිතයයි. ආගමට මුල් තැන දෙන මිනිහා නම් සත්‍යය මතු කරන්නට උත්සාහ කරන සම්‍යක් දෘෂ්ටියාය. හෙතෙම තමා ද නොරැවටී ලෝකය ද රැවටිල්ලෙන් මුදන්නට රැකුල් දෙන්නෙකි. ---- සිත එක අරමුණක යෙදීමේ කවර ක්‍රමයකින් වුවත් තාවකාලික ප්‍රයෝජනයක් හෝ ආශ්වාදයක් හෝ ලැබෙනු විනා 'මම' යන මායා බුබුල පුපුරුවා සදා සුවය මතු කරන සත්‍යය අවබෝධ කර ගන්නට නොහැකිය. හරි භාවනාව කවරේදැයි පුද්ගලයෙකුට දෙන්නෙකුට වැටහී ගොස් ඒ ක්‍රියාත්මක කළහොත් ඔවුන්ට ද ඔවුන්ගේ පරිසරයෙන් සෙස්සන්ට ද වන්නේ මහත් වැඩෙකි. ---- අවබෝධය ලත් මිනිසා සමාජයේ සෙස්සන් ද සුවපත් කරනු සඳහා සමාජයම බෙජෙනු විනා ඉන් පිටමං නොවන්නේය. ලෝකය වෙනස් කරන්නට එකකුට දෙන්නෙකුට පුළුවන. ඉතිහාසය දෙස බැලුවහොත් ලෝකයේ අද්භූත විපර්යාසයන් කර තිබෙන්නේ මහා ජනතාව නොව එකකු දෙන්නකු බව ඔබට පෙනී යා යුතුය." ('සුදර්ශනය', අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල.)



DN